I කොටස සඳහා පිළිතුරු

1. (3)	2. (4)	3. (5)	4. (5)	5. (2)
6. (2)	7. (4)	8. (2)	9. (4)	10. (3)
11. (4)	12. (4)	13 (2)	14. (2)	15. (3)
16. (1)	17. (3)	18. (2)	19. (2)	20. (1)
21. (1)	22. (4)	23. (3)	24. (3)	25. (4)
26. (5)	27. (2)	28. (4)	29. (1)	30. (2)
31. (4)	32. (5)	33. (4)	34. (3)	35. (5)
36. (3)	37. (1)	38. (2)	39. (1)	40. (3)
41. (1)	42. (5)	43. (3)	44. (2)	45 (3)
46. (4)	47. (5)	48. (5)	49. (1)	50. (5)
51. (5)	52. (2)	53. (2)	54. (3)	55. (2)
56. (3)	57. (4)	58 (4)	59. (2)	60. (1)

පිළිතුරු

A කොටස - ව්‍යුහගත රචනා


01 ප්‍රශ්නය

(a) (i) $P = h\rho g + \pi$ වේ.

මෙහි π වායු ගෝලීය පීඩනය වේ.

$h = 0$ වන $P_0 = \pi$ වේ.

(ii) h අක්ෂයට සමාන්තර සරල රේඛාවකි.



(iii) භාජනය නිදහසේ වැටෙන විට එහි ඇති ද්‍රවය නිසා ඇතිවන ද්‍රව්‍යතියි නිරවුම ශූන්‍ය වේ.


(b) (i) ද්‍රව්‍යස්ථිති පීඩනය මඟින් කරන කාර්යය W නම්

$W = V \times \Delta\rho$


$W = V \times h\rho g$

(ii) $Vh\rho gV = \frac{1}{2} mu^2$

$Vh\rho g = \frac{1}{2} v\rho u^2 \quad \therefore u^2 = 2gh \quad u = \sqrt{2gh}$



(c) $\downarrow y = ut + \frac{1}{2}gt^2$




$\therefore y = 0 + \frac{1}{2}gt^2$

$S = ut$

$= \sqrt{2gx}\ \sqrt{\frac{2y}{g}}$

$= 2\sqrt{xy}$



$x_1 = 2\sqrt{a \times 3a} \quad x_2 = 2\sqrt{2a \times 2a} \quad x_3 = 2\sqrt{3a \times a}$

$x_1 = 2a\sqrt{3} \quad x_2 = 4a \quad x_3 = 2\sqrt{3a}$

02 ප්‍රශ්නය

(a) A දණ්ඩේ කෙළවර රත් කිරීමට
B දණ්ඩෙන් තාප අවශෝෂණය කර ගැනීමට
C තාප හානිවීම වැළැක්වීමට

(b) BA දිශාවට

(c) නියත පීඩන හිස

(d) අනවරත අවස්ථාවේදී


(e) θ_3 හා θ_4 පාඨාංක හා ජලයේ ස්කන්ධය (m) හෝ පරිමාව (v) හා එම ජලය ගලා ගිය කාලය (t)

(f) $KA\left(\frac{\theta_1 - \theta_2}{L}\right) = MC_w\left(\frac{\theta_3 - \theta_4}{t}\right)$


(g) දුර්වල සන්නායකයක් තාපයේ අක්ෂිය ගැලීම ඉතා පහත් බැවින්, $\theta_1 - \theta_2$ සඳහා මැනිය හැකි තරමේ අගයක් ලැබෙන්නේ නැත. එනම් දණ්ඩ දිගේ උෂ්ණත්ව අනුක්‍රමණය කුඩාවේ. ∴ මැන ගැනීමට නොහැකි වේ.

03 ප්‍රශ්නය

(a)



(b)



රසදිය බඳුන කාචය පාකර එහි ප්‍රධාන අක්ෂය ඔස්සේ සීරුමාරු කරන ඇල්පෙනෙත්තක් එහි ප්‍රතිබිම්බය සමඟ සමපාත කිරීමෙන්.


(ii) $\frac{1}{V} - \frac{1}{U} = \frac{1}{f}$ කාච සූත්‍රයට U වල අගය සහ f ආදේශයෙන් අගය සොයන්න. V = R වේ. f වල අගය පළමුව සොයාගෙන ඇත.

(c) $\frac{1}{f} = (n - 1)\left(\frac{1}{r_1} - \frac{1}{r_2}\right)$

ලකුණු සම්මුතිය

(d) ගෝලමානය

(e) (i) $\frac{1}{f} = \frac{1}{f_1} + \frac{1}{f_2}$



$\frac{-2}{75_1} = \frac{-1}{25_1} + \frac{1}{f_2}$

$\frac{1}{f_2} = \frac{1}{25} - \frac{2}{75}$

$f_2 = 75\ cm$

(ii) දුව කාචයට $\frac{1}{f} = (n - 1)\left(\frac{1}{r_1} - \frac{1}{r_2}\right)$


$\frac{1}{75} = (n - 1)\left(\frac{1}{30} - \frac{1}{\infty}\right)$

$(n - 1) = \frac{30}{75}$ එමනිසා $n = 1.4$


04 ප්‍රශ්නය

(a) (i) P කෝෂය නියත ධාරාවක් සැපයීම කළ යුතුය.
(ii) AB කම්බිය ඒකාකාර හරස්කඩක් සහ ඒකාකාර ප්‍රතිරෝධයක් ඇති, කම්බියක් විය යුතුය.

(b) (i)



(ii)



(iii) කම්බිය ක්‍රමාංකනය කරන විට E_x තුළින් විශාල ධාරාවක් ලබා ගැනීම වළක්වාලීම සඳහා හෝ ගැල්වනෝමීටරය විශාල ධාරාවන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා


(iv) $E = E_s \times \frac{l_2}{l_1}$

(c) (i) Y කෝෂයේ වි.ගා.බල නරහා ඇති විභව අන්තරයට වඩා විශාල වීම.

(ii) P හා Y කෝෂවල විරුද්ධ අග්‍ර එකට සම්බන්ධ කර තිබීම.

(d) කම්බියේ කෝෂ වලින් බොහෝ වේලා එක දිගටම ධාරාව ලබා ගන්නා නිසා ඒවායේ වි.ගා.බ. ලෙස ලැබෙන්නේ දෝෂ සහිත අගයකි. (කෝෂ වල සිදුවන ධ්‍රැවන ක්‍රියාවලිය නිසා)

(e)



B කොටස

01 ප්‍රශ්නය

(a) යං මාපාංකය

කිසියම් වස්තුවක් ආතන්‍ය බලයකට ලක්වූ විට ප්‍රත්‍යස්ථ සීමාව (හෝ සමානුපාතික සීමාව) තුළදී ආතන්‍ය ක්‍රියාවට ආතන්‍ය ප්‍රත්‍ය බලය දක්වන අනුපාතය යං මාපාංකය ලෙස හැඳින්වේ.

හෝ

ප්‍රත්‍යස්ථ සීමාව තුළදී (හෝ සමානුපාතික සීමාව තුළදී)

$$\text{යං මාපාංකය} = \frac{\text{ආතන්‍ය ප්‍රත්‍ය බලය}}{\text{ආතන්‍ය ක්‍රියාව}}$$

හෝ

ප්‍රත්‍යස්ථ සීමාව තුළදී (හෝ සමානුපාතික සීමාව තුළදී)

යං මාපාංකය $E = \frac{F/A}{e/l_0}$ හෝ $Y = \frac{F/A}{e/l_0}$


F = ආතන්‍ය බලය A = ඒර්ගඵලය

e = විතතිය l_0 = ආරම්භක දිග

$E \propto Y \propto$ යං මාපාංකය

කම්බි සාම්පලයක යං මාපාංකය පරීක්ෂණාත්මකව නිර්ණය කිරීම.

උපකරණ ඇටවුම



ක්‍රමය

(i) තුලා තැටියට 500g ක පඩියක් යොදා මුල් පාඨාංකය ගන්න. පසුව තවත් 500g ක් යොදා පාඨාංකය ගෙන ඉන් මුල් පාඨාංකය අඩුකර විතති සොයා ගන්න. මෙසේ වරකට 500 g බැගින් පඩි දැඩි කරමින් පස් වරක් පාඨාංක ගෙන විතති සොයා ඉන්පසු වරකට 500g බැගින් පඩි අස් කරමින් ද විතති ගෙන මධ්‍යගතය ගන්න. එය e වේ. l_0 වර්නියර් ශූන්‍යයේ සිට බර යොදන කම්බිය ගැට ගැසූ ලක්ෂ්‍යයට දුර මීටර් කෝදුවෙන් මැනගන්න. එකිනෙකට ලම්බක දිශා දෙකක් ඔස්සේ බර යොදන කම්බියේ විෂ්කම්භය මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානයෙන් ස්ථාන කිහිපයකදී මැන මධ්‍යගතය ගෙන A ගණනය කරන්න.

$$E = \frac{F/A}{e/l_0}$$

$$E = \frac{e}{l_0} = \frac{f}{A}$$

$$E \times \frac{e}{l_0} = \frac{W}{\pi r^2}$$

$$e = \left(\frac{l_0}{E\pi r^2}\right) W$$

e සහ W අතර ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න.

ප්‍රස්තාරයේ අනුක්‍රමණයෙන් (m) E හි අගය ගණනය කරන්න.

$m = \frac{l_0}{E \times \pi r^2}$ $\therefore E = \frac{l_0}{m \times \pi r^2}$ මෙහි r - කම්බියේ මධ්‍යගතය අරය වේ.

සංඛ්‍යාත්මක ගැටලුව

දෙන ලද සැකැස්මට අනුව

වානේ කම්බියේ විතතිය = තඹ කම්බියේ විතතිය

$F = \frac{EA}{L}$ e යොද ගැනීමෙන්

වානේ කම්බියට

$F_1 = \frac{E_1 A}{L}$ e ..... (1)

තඹ කම්බියට

$F_2 = \frac{E_2 A}{L}$ e ..... (2)

මුළු බලය = 20

$F_1 + F_2 = 20$


(1) + (2) න්

$\frac{Ae}{L}(E_1 + E_2) = 20$

$\therefore e = \frac{20 \times 1}{\pi \times 10^{-6}} \times \frac{1}{(1.2 + 2.0) \times 10^{11}}$

$= 1.99 \times 10^{-5}$ m

(b)



සමීකරණය ව්‍යුත්පන්න කිරීම

(A) පෘෂ්ඨීක ආතති බලය = $2\pi RT$

ඇතුළත පීඩනය නිසා බලය = $P_1\pi R^2$

පිටත පීඩනය නිසා බලය අර්ධ ගෝලය මත ක්‍රියා කරන

බාහිර බලවල සමතුලිතතාව සලකමු = $P_2\pi R^2$

$2\pi RT + P_2\pi R^2 = P_1\pi R^2$

$P_1 - P_2 = \frac{2T}{R}$

(B) $PA = 10^5 + (40 \times 10^{-3} \times 1 \times 10^3 \times 10)$

$= (10^5 + 400)$ Pa

$P_B = 10^5 + (20 \times 10^{-3} \times 1 \times 10^3 \times 10)$

$= (10^5 + 200)$ Pa

$$P_C = 10^5 + 200 + \frac{2 \times 7.2 \times 10^{-2}}{0.5 \times 10^{-3}}$$


$$= 10^5 + 488 \text{ Pa}$$

$P_C = P_D$

$P_D = P_E$

නෝ $P_C = P_D = P_E$

(C)



(D) ගණනය කිරීම

මට්ටම් අන්තරය h යැයි සලකමු

පීඩන අන්තරය $= h \times 10^3 \times 10$

$h \times 10^3 \times 10 \propto 488$

$h = 48.8$ mm

02 ප්‍රශ්නය

1. බොයිල් නියමය : උෂ්ණත්වය නියත අවල වායු ස්කන්ධයක පරිමාව පීඩනයට ප්‍රතිලෝමව සමානුපාතික වේ. t^0C හා m නියත විට $P \propto 1/V$

$\therefore P = k/v \quad \therefore PV = k$


2. චාල්ස් නියමය : පීඩනයට නියත අවල වායු ස්කන්ධයක පරිමාව, නිරපේක්ෂ උෂ්ණත්වයට අනුලෝමව සමානුපාතික වේ. P හා m නියත විට $v \propto T \qquad v = kT$

$P_1 V_1 = P_2 V$

$$\frac{P_1 V_1}{P_2} = V'$$

$$\frac{V_2}{T_2} = \frac{V'}{T_1}$$

$$V' = \frac{V_2 T_1}{T_2}$$



$$\therefore \frac{P_1 V_1}{P_2} = \frac{V_2 T_1}{T_2}$$

$$\frac{P_1 V_1}{T_1} \propto \frac{P_2 V_2}{T_2}$$

එමනිසා දෙන ලද වායු ස්කන්ධයක පීඩනය, පරිමාව හා උෂ්ණත්වය යන සියල්ල වෙනස් වේ නම්,


$\frac{PV}{T}$ = නියතයක් වේ.

$PV = nRT \quad n$ = මවුල ගණන

R = මවුලයකට වායු නියතය හෝ සර්වත්‍ර වායු නියතය වේ.

වායු සමීකරණය $PV = nRT$

මවුල ගණන $n = \frac{PV}{RT}$



$T = 300$ K දී

$$n = \frac{700 \times 2V}{R \times 300}$$

A අයිස්වල ඇති විට, $n_1 = \frac{PV}{R \times 273}$

B 100^oC ඇති විට $n_2 = \frac{PV}{R \times 373}$

නමුත් $n_1 + n_2 = n$

$$\frac{PV}{R \times 273} + \frac{PV}{R \times 373} = \frac{700 \times 2V}{R \times 300}$$

$$P\left(\frac{1}{273} + \frac{1}{373}\right) = \frac{2 \times 7}{3}$$

$$P = \frac{2 \times 7}{3} \times \frac{273 \times 373}{646}$$


$= 735.6$ mm Hg

03 ප්‍රශ්නය

(a) අවධි කෝණය

ආලෝක කිරණයක් ගහණතර මාධ්‍යයක සිට විරල මාධ්‍යයකට ගමන් කරන විට, 90^o වර්තන කෝණයට අදාළ වන පතන කෝණය අවධි කෝණය නම් වේ.

හෝ පහත රූප සටහන



ගහණතර මාධ්‍යයේ වර්තනාංකය n

$$n = \frac{\sin 90}{\sin C} = \frac{1}{\sin C}$$

(i) වීදුරු - වාත


$\frac{3}{2}$ = n වීදුරු

$\frac{3}{2} \sin c = 1 \sin 90^0$

$\therefore \sin c = \frac{2}{3}$

$\sin c = 0.6667$

$c = 41^0 48' //$



(ii) ජල - වීදුරු


$n = \frac{3}{2}$

$\frac{3}{2} \sin c = \frac{4}{3} \sin 90^0$

$\therefore \sin c = \frac{8}{9}$

$= 0.8889$

$c = 62^0 44'$



P අල්පෙනෙත්ත වීදුරු කුට්ටියට ආසන්න නිසා x - 0


පතන කෝණය i විට $\tan i = \frac{t}{x}$


P, AD ට ආසන්න නිසා x - 0

$\therefore \tan i =$

$i = 90^0$

එවිට පතන කෝණය 90^0 වේ.






$\theta + 41^0 48' = 90^0$

$\theta + 41^0 48' = 89^0 60'$


$\theta = 48^0 12'$

$\therefore \theta > C$

කිරණය AB මුහුණතින පූර්ණ අභ්‍යන්තර පරාවර්තනය වේ. $\therefore$ AB තුළින් P අල්පෙනෙත්ත දක්නට නොලැබේ. $\theta > C$ නිසා කිරණ නැවතත් පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයට ලක්වේ. $\therefore$ අල්පෙනෙත්ත දැනුත් දක්නට නොලැබේ.



(b)



නාභි දුර 2cm වන කාචය අවනෙත ලෙසද අනෙක උපනෙත ලෙසද කෝරාගත යුතුයි.

අවසාන ප්‍රතිබිම්බය අනන්තයේ සාදන බැවින් අවනෙතින් සෑදෙන වස්තුවේ ප්‍රතිබිම්බය උපනෙත්තේ නාභිය මත සෑදිය යුතුයි.


අවනෙත සඳහා

$\frac{1}{v} - \frac{1}{u} = \frac{1}{f}$ යෙදීමෙන්

$-\frac{1}{10} - \frac{1}{u} = \frac{-1}{2}$

$u = 2.5$ cm

වස්තුව අවනෙතට 2.5 cm ඉදිරියෙන් තැබිය යුතුයි.



$M = \frac{\text{අවසාන ප්‍රතිබිම්බය ඇසේ ආපාතනය කරන කෝණය}}{\text{වස්තුව විශද දෘෂ්ටියේ අවම දුරේ ඇති විට ඇසෙ ආපාතනය කරන කෝණය}}$

$M = \frac{\theta'}{\theta}$

$= \frac{h'/f_2}{h/D} = \frac{h'}{h} \cdot \frac{D}{f_2} = \left(\frac{V}{f_1} - 1\right)\left(\frac{D}{f_2}\right)$

$M = \left(\frac{10}{2} - 1\right)\left(\frac{25}{10}\right)$

$M = 10$

(i) නැත.

ඈත පිහිටි වස්තුවක, මෙම සැකැස්ම මගින් ලැබෙන අවසාන ප්‍රතිබිම්බය ඉතා කුඩා එකක් වන බැවිනි.

04 ප්‍රශ්නය

ස්පන්ද :- ආසන්න වශයෙන් සමාන සංඛ්‍යාතයකින් යුතු ප්‍රභව දෙකක් එකවර නාද කළ හොත් නිපදවෙන ශබ්දය ප්‍රත්‍යාවර්තව හඬ උස් පහත් වීම් දක්වයි. මෙම සමාකාර අන්තරවලදී ඇතිවන තීව්‍රතා වෙනස්වීම් ස්පන්ද නම් වේ.

හෝ

ආසන්න වශයෙන් සමාන සංඛ්‍යාතවලින් යුතු තරංග දෙකක නිරෝධනය නිසා ඇති වන හඬේ සැර වෙනස්වීම් වේ.

තත්පරයකට ඇතිවන ස්පන්ද සංඛ්‍යාව සංඛ්‍යාත දෙකේ අන්තරයට සමාන වේ.

$V = \sqrt{\frac{T}{m}}$

$V = f\lambda$

$f = \frac{(n+1)}{2l}\sqrt{\frac{T}{m}}$

සමඟලේ සංඛ්‍යාතය f යැයි ද කම්බියේ සංඛ්‍යාතය f_1 යැයි ද සලකමු.

$l = 60$ cm

$f - f_1 = 5. \rightarrow f_1 = f - 5$

f කම්බියේ සංඛ්‍යාතය නම් $l = 58$ cm

$f - f_2 = 2. \rightarrow f_2 = f - 2$

$$\frac{f}{l} = \frac{58}{60} = \frac{29}{30}$$

$$\frac{f-5}{f-2} = \frac{29}{30}$$

$f = 208$ Hz නෝ

$f - f_1 = 5 \rightarrow$ [illegible]

$f = 2 \rightarrow$ [illegible]

$$\frac{l_1}{l} = \frac{29}{30}$$

$$\frac{l-5}{l-2} = \frac{29}{30}$$

$f = 208$ Hz

05 ප්‍රශ්නය

නිසියම් ද්‍රව්‍යයක ප්‍රතිරෝධකතාවය යනු ඒකක දිගක් සහ ඒකක හරස්කඩ වර්ගඵලයක් ඇති එම ද්‍රව්‍යයෙන් තනන ලද කුට්ටියක (සෘජුඝෝණ ප්‍රාකාර) දෙපෙලවර අතර ප්‍රතිරෝධයයි.


නෝ

කම්බියක ප්‍රතිරෝධය R, එහි දිග l ට අනුලෝමව සමානුපාතික වන අතර වර්ගඵලය A ට ප්‍රතිලෝමව සමානුපාතික වේ.

$$R \propto \frac{l}{A}$$

$$\therefore R = \frac{\rho l}{A}$$

මෙම සමානුපාතික නියතය ρ එම කම්බියේ ප්‍රතිරෝධකතාව ලෙස හැඳින්වේ.



කම්බියේ සඵල හරස්කඩ වර්ගඵලය

$= \pi (2a)^2 - \pi a^2 = 3a^2\pi$

කම්බියේ දෙකෙළවර අතර ප්‍රතිරෝධය

$$R_1 = \frac{\rho_1 l}{3a^2\pi}$$

සන්නායක ද්‍රව්‍යයෙන් පුරවන ලද කොටසෙ හරස්කඩ වර්ගඵලය $= \pi a^2$

පුරවන ලද සිලින්ඩරාකාර කොටසේ ප්‍රතිරෝධය

$$R_1 = \frac{\rho_2 l}{\pi a^2}$$

මුළු දණ්ඩේ ප්‍රතිරෝධය = R_2 නම්

$$\frac{1}{R_2} = \frac{1}{R_1} + \frac{1}{R}$$

$$= \frac{3\pi a^2}{\rho_1 l} + \frac{\pi a^2}{\rho_2 l}$$

$$R_2 = \frac{\rho_1 \rho_2 l}{\pi a^2 (3\rho_2 + \rho_1)}$$


නැත.

A_1 හා A_2 සෘජු හරස්කඩ වර්ගඵලයන් නොවෙනස්ව පවතී. (බරයේ අක්ෂය, දුර්වින ලද කොටසේ අක්ෂය හා සමපාත නැතත් ඒවා සමාන්තර වන බව නිසා)

R_2 අගයද වෙනස් නොවී පවතී.

06 ප්‍රශ්නය

A පරීක්ෂණය



ධාරා නියාමකය උපයෝගී කර ගැනීමෙන් ධාරාව වෙනස කරන්න. ධාරා තුලාවේ අනෙක් පැත්තේ බර වෙනස් කරමින් තුලා රාමුව තිරස්ව තබා ගන්න.

I ඉදිරියෙන් M හි ප්‍රස්තාරය අඳින්න.

$F = Mg$

ප්‍රස්තාරය සරල රේඛාවක් නම්

$Mg \propto I$

$\therefore F \propto I$ යන්න ලැබේ.

B ගණනය කිරීම.

බලය = BIL

$= 40 \times 10^{-6} \times 3 \times 25 \times 10^{-3}$


$= 3 \times 10^{-6}$ N

බලය සිරස්ව පහළටය (ෆ්ලේමිං ගේ [illegible] නියමය)

වම් අතේ මහපට ඇඟිල්ල, දබර ඇඟිල්ල සහ මැද ඇඟිල්ල එකිනෙකට ලම්බකව තැබූ විට දබර ඇඟිල්ලෙ දිශාවෙන් ක්ෂේත්‍රයේ දිශාවත් මැද ඇඟිල්ලේ දිශාව [illegible] දිශාවත් නිරූපණය කරයි නම් එම අතේ මහපට ඇඟිල්ල [illegible] දිශාව දක්වනු ඇත.

සන්නායකය N - S දිශාවට තබා ඇතහොත් [illegible] ශූන්‍ය වේ. ඊට හේතුව ක්ෂේත්‍රය හා ධාරාව එකට දිශා [illegible] නිසා බලයක් නොමැති වීමයි.

(b) (A)



පැහැදිලි කිරීම

ස්වර්ණ පත්‍ර විද්‍යුත් දර්ශකයේ තැටිය ධන ආරෝපණයක් ලබා ගන්නා අතර පත්‍ර සෘණ ආරෝපණයක් ලබා ගනී. මේ නිසා පත්‍ර අපසරණය වේ.

(B) (i) දණ්ඩ ඉවත් කළ විට ලොම් කැබැල්ලේ ශුද්ධ ආරෝපණයක් ඉතිරි වී ඇත.
මෙම ආරෝපණයට රන්පත්‍ර මත ආරෝපණයක් ප්‍රේරණය කළ හැකි අතර එවිට ඒවා අපසරණය වේ.

(ii) දණ්ඩ බඳුන තුළට නැවත ගෙන ගිය විට බඳුන තුළ ශුද්ධ ආරෝපණයක් නැත.
තහඩු ආරෝපණ නොදරණ අතර අපසරණයක්ද ඇති නොවේ.

(C) පිරිමැදීමේදී ආරෝපණ මාරුවක් සිදු වේ. පිරිමදින වස්තුව මත ඇතිවන ආරෝපණය පිරිමැදෙන ද්‍රව්‍යය මත ඇතිවන ආරෝපණයට විශාලත්වයෙන් සමාන වේ.
ඒවා ලකුණෙන් ප්‍රතිවිරුද්ධය.
EHT ප්‍රභවය ස්වර්ණ පත්‍ර විද්‍යුත් දර්ශකයේ තැටිය හා ආවරණය අතර සම්බන්ධ කරන්න. රන් තහඩුවල සෙවනැල්ල තිරයක් මත ලබා ගැනීමට පහනක් සකසන්න.
EHT ප්‍රභවය මඟින් දන්නා විභවයක් සපයමින් තහඩුවල පිහිටීම තිරය මත ලකුණු කරන්න.
මෙම වෝල්ට් මීටරය ස්ථිති විද්‍යුත් වෝල්ට් මීටරයක් වන අතර විභවය මනිනු ලබන ප්‍රභවයෙන් කිසිදු ධාරාවක් ලබා නොගනී.